# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1800/27 - 2013 මාර්තු මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2013.03.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, මෙහි උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති තීරණ ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29 (3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2013 මාර්තු මස 01 වැනි දින සිට වලංගු විය යුතුය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2013 මාර්තු මස 01 වැනි දින,
කොළඹ දී ය.

*උපලේඛනය*

රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1971 අප්‍රේල් මස 29 වැනි දින අංක 14955/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළවූ නිවේදනයෙහි වූ උපලේඛනයේ සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දාවූ ද, අවසන්වරට 2010 ජූනි මස 30 වැනි දින අංක 1660/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ වූ නිවේදනය මගින් වෙනස් කරන ලද තීරණ එම උපලේඛනයෙහි II වැනි කොටස වෙනුවට පහත සඳහන් නව කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.

11 වන කොටස

**සේවක පන්තිය**

*1 වැනි ශ්‍රේණිය (පුහුණු)*

මෝස්තරකරුවෝ, කැටයම්කරුවෝ, රටා පිළිබඳ ජොබර්වරු, (වියන අංශය) ඉදිරිපස සයිසිං යන්ත්‍රකරුවෝ, වැද්දුම්කරුවෝ, කාඩිං අංශය, වේගප්‍රේම් අංශය, නූල් කටින අංශය, වයින්ඩිං අංශය, වෝපිං අංශය, සයිසිං අංශය, වියන අංශය.

1A - PG 001574 — 1,085 (2013/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*ප්‍රධාන ජොබර්වරු :*

වේගප්‍රේම් අංශය, නූල් කටින අංශය, වියන අංශය.

*ජොබර්වරු :*

නිමැවුම් අංශය, සයිසිං අංශය, කොම්බිං අංශය, කාඩ් අංශය.

*පේලි ජොබර්වරු :*

වියන අංශය

*11 වැනි ශ්‍රේණියේ (පුහුණු)*

*නූල් කඳන් ගැටගසන්නෝ, ජොබර්වරු :*

ගුදම් අංශය, මුද්‍රණ අංශය, සායම් අංශය, බිලිචිං අංශය, ඩබ්ලිං අංශය, වයින්ඩිං අංශය, වෝපිං අංශය, ඩ්‍රොයිං අංශය, මික්සිං සහ බ්ලෝරූම් අංශය.

*ජොබර් සහායකවරු :*

කාඩිං අංශය

*පේලි ජොබර්වරු :*

නූල් කැටීමේ අංශය, වේගප්‍රේම් අංශය, හිරවූ වියමන සකසන්නෝ, වියන්නෝ,

*අඩ පුහුණු*

බේල් කරන්නෝ (මිටි බැඳීම හා බේල් කිරීම) බැන්ඩර්වරු, මිටි බඳින්නෝ, කැලැන්ඩර් යන්ත්‍ර කරුවෝ, වඩු කාර්මිකයෝ, රසායන කරුවෝ, ශීත කරණ යන්ත්‍ර කරුවෝ, ගණන් කරන්නෝ.

*නූල් අංශය - කටර්ස් :*

රෝලර්වරු, ක්‍රීල් බොයිස් (වෝපිං අංශය ) කපන්නෝ

*කාඩ් අංශය :*

කැපුම් බලන්නෝ/ප්‍රධාන කැපුම් බලන්නෝ, ඩෝෆර්වරු, ඩබ්ලර්වරු, නූල් අදින්නෝ, සරසන්නෝ.

*නූල් අංශය :*

වියලන යන්ත්‍රකරුවෝ, සායම් පොවන්නෝ, විස් සහ බිම් අංශය

*මිමි තබන්නෝ :*

ස්පින්ඩ්ල් අංශය, සෝදිසි කරන්නෝ, ප්‍රථම වියමන් වැද්දුම්කරුවෝ, සහායක මුවහත් කරන්නෝ, කාඩ්ප්ලැට් අංශය, හයිඩ්‍රෝ, එක්ස්ට්‍රැක්ටර් ක්‍රියාකරුවෝ.

*ජොබර්වරු, ඩොපිං අංශය :*

ජිගර් යන්ත්‍රකරුවෝ, කංකානම්වරු, ක්යර් යන්ත්‍රකරුවෝ, මැෂින් ඇටෙන්ඩර්වරු, ටබ්ලර් බැන්ඩිං අංශය

*යන්ත්‍රකරුවෝ :*

එන්ජින් අංශය, කොම්බිං අංශය, ක්‍රොපිං සහ ෂියරිං අංශය, පැඩිං අංශය, මුද්‍රණ අංශය, රිබන් ලැප් අංශය, සිල්වර් ලැප් අංශය, සෝපිං අංශය.

*යන්ත්‍ර සේවිකාවෝ :*

ඇඳ ඇතිරිලි,

*මර්ස්ර්රයිසර් යන්ත්‍රකරුවෝ, සංයෝජකයෝ :*

වර්ණය, ප්‍රමාණය

*නූල් අමුණන්නෝ, රිල්වරු, අලුත්වැඩියා කරන්නෝ :*

කෝම්බිං ඉදිකටු, ප්ලෙන්ජ දැල් සහ පණා, ස්පින්ඩල්, ඉත්තන්ගේ කුරු, සැම්පල්කරුවෝ, සැන්ෆෝරයිසර් යන්ත්‍රකරුවෝ, ස්ක්‍රීන් පිළියෙල කරන්නෝ, ස්ක්‍රීන් මුද්‍රණකරුවෝ, පිළියෙල කරන්නෝ.

*කාඩ් අංශය :*

මහන්නෝ, සින්ජින් සහ ඩිසයින් යන්ත්‍ර ක්‍රියාකරුවෝ / සයිසිං යන්ත්‍ර ක්‍රියාකරුවෝ - පිටුපස

*පනාකඳ සකසන්නෝ, ස්පිනර්ස් :*

මියුල්රිං, ස්ටෙන්ටර් යන්ත්‍රකරුවෝ, මහන්නෝ, ටේප් ටෙන්ඩර්වරු, කාඩ් ඩොයිං, ඉන්ටර් රීඩිං සිම්ලෙක්ස්, ස්ලිබිං, වෙස්ට් කාඩ්.

*බක්කිකරුවෝ :*

නූල් කැරලි සුදු කිරීම, නූල් කැරලි සායම් කිරීම, කපු නූල් සායම් කිරීම.

*වයින්ඩර්වරු*

ස්වයංක්‍රීය පර්න්ග්‍රේ, චිස් කෝන්, ඩබ්ලර්, යුනිවර්සල් පර්න්, එතුම්කරුවෝ (නූල් කටින අංශය)

*නුපුහුණු .-*

බැක්පලර් යන්ත්‍රකරුවෝ, බේල්කරන්නෝ, (ගුදම්), බේල් ලකුණු කරන්නෝ, බේල් කිරීම පරීක්ෂා කරන්නෝ, බැටරි පුරවන්නෝ, ගෙනයන්නෝ, බින්, බොබිං, කපුපිළි, ඩොප්, ලැප්, සටහන් පුවරු.

*සුද්ධ කරන්නෝ :*

ලූම් යන්ත්‍ර, ඉපියන්, බැම් රෙදි ගොඩ ගසන්නෝ, ක්‍රීල් බොයිස් (බුමුතුරුණු අංශය). බැම් කපන්නෝ ඉවත යන පුළුන් එකතු කරන්නෝ,

නැවුම්කරුවෝ,

ග්‍රීස්, අත්.

*උදව්කරුවෝ, කම්කරුවෝ, යන්ත්‍රකරුවෝ :*

ජිගින්, විලෝ, බ්‍රිලෙන්ඩිං සේදීම, අංක සලකුණු කරන්නෝ / සේවකයෝ, තෙල් දමන්නෝ, අසුරන්නෝ

*රොඩු අහුලන්නෝ, ප්ලේටර්වරු :*

ඉදිරිපස / පසුපස

සහකාර රොලර් ආවරණකරුවෝ, රෝවිං වේස්ට් ඔපන්වරු, සීඩී එකතුකරන්නෝ සහ අසුරන්නෝ, ස්කෙවර්ස් අලුත්වැඩියා කරන්නෝ, සේල්මේකර්.

සහායකවරු , (මුද්‍රා තබා මිටි බඳින්නෝ) :

මසන්නෝ මලු - පටි ස්ටරයිපර්වරු, ස්කච්ර්වරු, අමදින්නෝ, නූල් අහුලන්නෝ, නූල් කිරුම්කරුවෝ / ස්කේල්මන්වරු- ෆර්න්වයින්ඩර්වරු (බුමුතුරුණු අංශය) නූල් සමනය කරන්නෝ සහ බෙදා හරින්නෝ.

**මසකට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය**

| *සේවා වර්ෂය* | *නුපුහුණු* *රු. ශ.* | *අර්ධ පුහුණු* *රු. ශ.* | *පුහුණු II* *රු. ශ.* | *පුහුණු I* *රු. ශ.* |
|---|---|---|---|---|
| 1 වැනි වසර | 9,660.00 | 10,080.00 | 10,500.00 | 10,920.00 |
| 2 වැනි වසර | 9,760.00 | 10,205.00 | 10,650.00 | 11,095.00 |
| 3 වැනි වසර | 9,860.00 | 10,330.00 | 10,800.00 | 11,270.00 |
| 4 වැනි වසර | 9,960.00 | 10,455.00 | 10,950.00 | 11,445.00 |
| 5 වැනි වසර | 10,060.00 | 10,580.00 | 11,100.00 | 11,620.00 |
| 6 වැනි වසර | 10,160.00 | 10,705.00 | 11,250.00 | 11,795.00 |
| 7 වැනි වසර | 10,260.00 | 10,830.00 | 11,400.00 | 11,970.00 |
| 8 වැනි වසර | 10,360.00 | 10,955.00 | 11,550.00 | 12,145.00 |
| 9 වැනි වසර | 10,460.00 | 11,080.00 | 11,700.00 | 12,320.00 |
| 10 වැනි වසර | 10,560.00 | 11,205.00 | 11,850.00 | 12,495.00 |

03-914/1

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**මෝටර් රථ ගමනා ගමන කර්මාන්තය**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ මෝටර් රථ ගමනා ගමන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, මෙහි වූ උපලේඛනයේ නිශ්චිතව සඳහන් තීරණ ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමන් විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29 (3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2013 මාර්තු මස 01 වැනි දින සිට වලංගු විය යුතුය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2013 පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

මෝටර් රථ ගමනා ගමන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1947 පෙබරවාරි මස 14 වැනි දින අංක 9667 දරන *ගැසට් පත්‍රයේ* පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කල වෙනස් කරන ලද්දාවූ ද, සහ අවසන්වරට 2010 ජූනි මස 30 වන දින අංක 1660/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද්දා වූ තීරණ පහත දැක්වෙන පරිදි තවදුරටත් එම උපලේඛනයෙහි II වැනි කොටස වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.

II වන කොටස

කම්කරුවාගේ පංතිය

*ඒ පංතියේ කම්කරුවෝ* —

මගීන් 22 කට වැඩියෙන් ගෙන යාමට අවසර ලත් බස්රථ රියැදුරෝ.

*බී පංතියේ කම්කරුවෝ—*

මගීන් 22ක් හෝ ඊට අඩු ගණනක් ගෙන යාමට අවසරලත් බස්රථ රියැදුරෝ, ගිලන් රථ රියැදුරෝ හා හොණ්ඩර 20 කට වැඩි බර ගෙන යාමට අවසරලත් ලොරි (වත්තකට අයිති වූ හා එම වත්තෙහි අභ්‍යන්තර ගමනාගමනයෙහි පමණක් යොදවන්නා වූ ලොරි හැර) හා වෑන්රථ රියැදුරෝ.

*සී පංතියේ කම්කරුවෝ —*

කුලී කාර් සහ කැබ් රථ රියදුරෝ, හොණ්ඩර 20 හෝ ඊට අඩු බරක් ගෙන යාමට අවසරලත් ලොරි (වත්තකට අයිති වූ හා එම වත්තෙහි අභ්‍යන්තර ගමනාගමනයෙහි පමණක් යොදවන්නා වූ ලොරි හැර) හා වෑන්රථ රියදුරන්, ත්‍රීරෝද රථ රියදුරන් හා මිනී රථ රියැදුරන්.

*ඩී පංතියේ කම්කරුවෝ —*

ප්‍රවාහන කාර්යයන් සඳහා යොදවනු ලබන ට්රේලර් සහිත ට්රේලර් සහිත ලොරි පදවන රියැදුරෝ (ස්කැමල් හෝස් වර්ගයේ ඒවා ඇතුළුව - එහෙත් වත්තකට අයිති වූ හා එම වත්තෙහි අභ්‍යන්තර ගමනාගමනයෙහි පමණක් යොදවන්නා වූ ට්රේලර් සහිත ලොරි, ට්රේලර් සහිත ට්‍රැක්ටර් හැර).

*ඊ පංතියේ කම්කරුවෝ -*

වත්තකට අයිති වූ හා එම වත්තෙහි අභ්‍යන්තර ගමනාගමනයෙහි පමණක් යොදවන්නාවූ පහත සඳහන් වන රථවල රියැදුරෝ එනම් (අ) ලොරි සහ (ආ) ට්රේලර් සහිත ට්‍රැක්ටර් රථ.

*එෆ් පංතියේ කම්කරුවෝ -*

බස්රථවල නියුක්ත කොන්දොස්තරවරු, ලිපිකරුවෝ, කැෂියර්වරු, ප්‍රවේශපත්‍ර ලිපිකරුවෝ, ආසන වෙන් කරන ලිපිකරුවෝ.

*ජී පංතියේ කම්කරුවෝ -*

හොණ්ඩර 20 කට වැඩි බරක් ගෙන යාමට අවසරලත් ලොරිවල ක්ලීනර්වරු සහ පෝටර්වරු.

*එච් පංතියේ කම්කරුවෝ -*

හොණ්ඩර 20 ක් හෝ ඊට අඩු බරක් ගෙන යාමට අවසරලත් ලොරිවල සහ බස්රථ, කුලී කාර්, කැබ් රථ, වෑන්රථ, ගිලන් රථ හා මිනී රථවල ක්ලීනර්වරු සහ පෝටර්වරු.

*අයි පංතියේ කම්කරුවෝ -*

බස්රථ චෙකර්වරු හෝ වේලාව තබන්නෝ

*එෆ් පංතියේ කම්කරුවෝ -*

බස්රථ පරීක්ෂකවරු සහ නැවතුම්පලවල පරිපාලකවරු

*කේ පංතියේ කම්කරුවෝ -*

මෝටර් රථ ගමනාගමන කර්මාන්තයෙහි යෙදී සිටින එහෙත්, මෙහි ඉහත කොටස්වල සඳහන් නොවූ කම්කරුවෝ.

ඉහත සඳහන් තීරණවල -

(අ) ''ක්ලීනර්වරු'' යන්නෙන් ලොරි, බස් රථ, කුලී කාර්, කැබ් රථ, වෑන් රථ, ගිලන් රථ හෝ මිනී රථ පිරිසිදුව තබා ගැනීමේ යොදවා සිටින (ලියකියවිලි වැඩෙහි නිරත සේවකයන් නොවන) කම්කරුවන් අදහස් කරනු ලැබේ.

(ආ) ''පෝටර්වරු'' යන්නෙන් ලොරි, බස් රථ, කුලී කාර්, කැබ් රථ, වෑන් රථ, ගිලන් රථ හෝ මිනී රථ යන මේවාට බඩු පැටවීමෙහි හෝ ඒවායේ බඩු බෑමෙහි යොදවා සිටින හා ඔවුන්ගේ වැඩ සම්බන්ධයෙන් ඒ රථ වලම ගමන් කිරීමට සිදුවන කම්කරුවන් අදහස් කරනු ලැබේ.

11 වැනි කොටස

**මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය**

| ආයතනයේ සේවා වර්ෂය | ඒ පංතිය ඩී පංතිය රු. ශ | බී පංතිය රු. ශ | සී පංතිය රු. ශ. | ඊ පංතිය එෆ් පංතිය ජේ පංතිය රු. ශ. | ජී පංතිය අයි පංතිය රු. ශ. | එච් පංතිය රු. ශ. | කේ පංතිය රු. ශ. |
|---|---|---|---|---|---|---|---|
| 1 වන වසර | 10.650.00 | 10,275.00 | 9,865.00 | 9,565.00 | 9,225.00 | 8,965.00 | 8,625.00 |
| 2 වන වසර | 10,850.00 | 10,450.00 | 10,015.00 | 9,690.00 | 9,325.00 | 9,065.00 | 8,725.00 |
| 3 වන වසර | 11,050.00 | 10,625.00 | 10,165.00 | 9,815.00 | 9,425.00 | 9,165.00 | 8,825.00 |
| 4 වන වසර | 11,250.00 | 10,800.00 | 10,315.00 | 9,940.00 | 9,525.00 | 9,265.00 | 8,925.00 |
| 5 වන වසර | 11,450.00 | 10,975.00 | 10,465.00 | 10,065.00 | 9,625.00 | 9,365.00 | 9,025.00 |
| 6 වන වසර | 11,650.00 | 11,150.00 | 10,615.00 | 10,190.00 | 9,725.00 | 9,465.00 | 9,125.00 |
| 7 වන වසර | 11,850.00 | 11,325.00 | 10,765.00 | 10,315.00 | 9,825.00 | 9,565.00 | 9,225.00 |
| 8 වන වසර | 12,050.00 | 11,500.00 | 10,915.00 | 10,440.00 | 9,925.00 | 9,665.00 | 9,325.00 |
| 9 වන වසර | 12,250.00 | 11,675.00 | 11,065.00 | 10,565.00 | 10,025.00 | 9,765.00 | 9,425.00 |
| 10 වන වසර | 12,450.00 | 11,850.00 | 11,215.00 | 10,690.00 | 10,125.00 | 9,865.00 | 9,525.00 |
| 11 වන වසර | 12,650.00 | 12,025.00 | 11,365.00 | 10,815.00 | 10,225.00 | 9,965.00 | 9,625.00 |
| 12 වන වසර | 12,850.00 | 12,200.00 | 11,515.00 | 10,940.00 | 10,325.00 | 10,065.00 | 9,725.00 |
| 13 වන වසර | 13,050.00 | 12,375.00 | 11,665.00 | 11,065.00 | 10,425.00 | 10,165.00 | 9,825.00 |
| 14 වන වසර | 13,250.00 | 12,550.00 | 11,815.00 | 11,190.00 | 10,525.00 | 10,265.00 | 9,925.00 |
| 15 වන වසර | 13,450.00 | 12,725.00 | 11,965.00 | 11,315.00 | 10,625.00 | 10,365.00 | 10,025.00 |

03-914/2

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**ගල්කොරි සහ කළුගල් කැඩීමේ කර්මාන්තය**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ ගල්කොරි සහ කළුගල් කැඩීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් තීරණ ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමන් විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29 (3) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2013 මාර්තු මස 01 දින සිට වලංගු විය යුතුය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2013 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

ගල්කොරි සහ කළුගල් කැඩීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, 2003 මාර්තු මස 12 වැනි දින අංක 1279/16 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කල වෙනස් කරන ලද්දාවූ සහ අවසන් වරට, 2010 ජුනි මස 30 දින අංක 1660/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද්දාවූ තීරණ පහත දැක්වෙන පරිදි එම උපලේඛනයේ II වන කොටස වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.

II වන කොටස

ගල්කොරි හා කළුගල් කැඩීමේ කර්මාන්තයේ නියුක්ත පහත දැක්වෙන පන්තිවලට අදාළ කම්කරුවන්ට කාල මිම්මේ වැඩ වෙනුවෙන් අදාල වන අවම මාසික වේතන ප්‍රමාණය පහත වගුවෙන් දැක්වෙන පරිදි විය යුතුය.

1. *පුහුණු* :

කළුගල් අතින් විදින්නන්, කළුගල් යාන්ත්‍රිකව විදින්නන්, බෝරවල වෙඩි බෙහෙත් පුරවන්නන්, ගිනි තැබීමෙන් බෝර පුපුරවන්නන්, බැටරි විදුලිබලය මගින් බෝර පුපුරවන්නන්.

2. *අර්ධ පුහුණු* :

අතින් ගල් කැබලි කරන්නන්, යන්ත්‍ර වලින් ලොකු ගල් කුඩා ගල්වලට කඩන්නන්, කළුගල් යන්ත්‍ර මගින් ලොරිවලට පුරවන්නන්, මෙටල් ක්‍රෂර් යන්ත්‍ර මගින් කළුගල් විවිධ ප්‍රමාණවලට කඩන්නන්, කැඩූ කළුගල් කැබලි යන්ත්‍ර මගින් ඉවත් කරන්නන්, කළුගල් කැබලි යන්ත්‍ර මගින් ගොඩගසන්නන්, කළුගල් කැබැලි යන්ත්‍ර මගින් ලොරිවලට පටවන්නන්,

3. *නුපුහුණු* :

සක්කා ගල් එකතු කරන්නන්, කළුගල් අතින් ලොරිවලට පටවන්නන්, කැඩූ කළුගල් කැබලි අතින්/ වීල්බරෝ මගින් ඉවත් කරන්නන්, කළුගල් කැබලි ගොඩගසන්නන්, ඉහත දැක්වෙන සියලුම වැඩවලට සම්බන්ධිත වූ හෝ ඊට අනුෂාංගික වූ කටයුතු කරන්නන්.

*මාසික අවම වේතන ප්‍රමාණය*

| *සේවා වසර* | *පුහුණු* | *අර්ධ පුහුණු* | *නුපුහුණු* |
|---|---|---|---|
| 1 වන වසර | 12,500.00 | 11,750.00 | 11,000.00 |
| 2 වන වසර | 12,650.00 | 11,875.00 | 11,100.00 |
| 3 වන වසර | 12,800.00 | 12,000.00 | 11,200.00 |
| 4 වන වසර | 12,950.00 | 12,125.00 | 11,300.00 |
| 5 වන වසර | 13,100.00 | 12,250.00 | 11,400.00 |

03-914/3

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**සුරුට්ටු සෑදීමේ කර්මාන්තය**

(136 වැනි අධිකාරය වන ) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ සුරුට්ටු සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් තීරණ ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමන් විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29 (3) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2013 මාර්තු මස 01 දින සිට වලංගු විය යුතුය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2013 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

සුරුට්ටු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, 1946ක් වූ ජූලි මස 26 වැනි දින අංක 9585 දරන ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූද, කලින් කලට වෙනස් කරන ලද්දාවූ ද අවසන් වරට, 2010 ජුනි මස 30 වැනි දින අංක 1660/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද දැන්වීම් වලින් වෙනස් කරන ලද්දාවූ ද තීරණ එම උපලේඛනයේ I වන කොටස වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.

I වන කොටස

**කැලි ගණනේ වැඩ වලට ගෙවිය යුතු අවම වැටුප් ප්‍රමාණයන්**

(දුම්කොළ පිරිසිදු කිරීම, එතීම සඳහා එතීම් කොළ සකස් කිරීම, කැපූ දුම්කොළ පිරවීම ද සහිතව එතීම සඳහා දුම්කොළ සකස් කිරීම, ඔතන ලද සුරුට්ටු නූලෙන් බැඳීම සහ සුරුට්ටු දහයේ මිටිවලට බැඳීම් ද ඇතුලුව ) සුරුට්ටු එතීම සඳහා කැලි ගණනේ වැඩ වලට ගෙවිය යුතු අවම වැටුප් ප්‍රමාණයන්.

සුරුට්ටු 1,000 කට රු. 595.00 ක් විය යුතුය.

03-914/4

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**ගිණිපෙට්ටි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ ගිණිපෙට්ටි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් තීරණය කරන ලදුව මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් තීරණ ගරු කම්කරු සහ කම්කරු සබඳතා ඇමතිතුමන් විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29 (3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2013 මාර්තු මස 01 දින සිට වලංගු විය යුතුය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2013 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

ගිණිපෙට්ටි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, 1947 මැයි මස 30 වැනි දින අංක 9708 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදනයේ උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දාවූ ද අවසන්වරට 2010 ජුනි මස 30 වැනි දින අංක 1660/35 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද්දාවූ තීරණ එම උපලේඛනයේ II වැනි කොටස වෙනුවට පහත සඳහන් අලුත් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.

II වන කොටස

**1 කාල මිම්මේ වැඩ සඳහා වූ අවම වේතන ප්‍රමාණය**

1 වැනි තීරයෙහි නිශ්චිතව සඳහන් කම්කරුවන්ට වැඩ කරන සාමාන්‍ය දිනකට අදාළ විය යුතු අවම වේතන ප්‍රමාණය II වැනි තීරයෙහි අනුරූප සටහනෙහි දැක්වෙන ප්‍රමාණය විය යුතුය.

| *1 වැනි තීරය*<br>*කම්කරුවන්ගේ පංතිය* | *11 වැනි තීරය*<br>*දිනකට ගෙවිය යුතු ප්‍රමාණය*<br>*රු. ශ.* |
|---|---|
| *1 වැනි ශ්‍රේණිය* | |
| මැෂින් ඩ්‍රයිවරයෙන් කූරු කැපීම, මැෂින් ඩ්‍රයිවරයෙන් කූරුපට්ට, ලාච්චු පතුරු, පෙට්ටි පතුරු හා අඩි පතුරු කැපීම, මැෂින් ඩ්‍රයිවරයෙන් පිහියා හා මෙවලම් මුවහත් කිරීම, මැෂින් ඩ්‍රයිවරයෙන් රූප රාමුවල කූරු සවි කිරීම, මැෂින් ඩ්‍රයිවරයෙන් කූරුවලට බෙහෙත් පෙවීම, මැෂින් ඩ්‍රයිවරයෙන් පෙට්ටිවලට බෙහෙත් ගෑම, මිශ්‍රණයෙන් ගිනිකූරු බෙහෙත් කවලම් කිරීම, මැෂින් ඩ්‍රයිවරයෙන් කඩදාසි කූරු කැපීම, ඕවර්සියර් හෝ කංකානම් වැඩ, මැෂින් ඩ්‍රයිවරයෙන් පෙට්ටි පිරවීම. | 380 0 |
| *2 වැනි ශ්‍රේණිය* | |
| අතින් හරස් අතට කපා, කුට්ටි කිරීම, මැෂින් ඩ්‍රයිවරයෙන් හරස් අතට කපා කුට්ටි කිරීම, කූරු මට්ටම් කිරීම, කපනයෙන් ලාච්චු පතුරු, පෙට්ටි පතුරු,අඩි පතුරු කැපීම, යන්ත්‍රානුසාරයෙන් පෙට්ටි ලාච්චු සෑදීම, අත් උදව්කාරයෙකු මගින් යන්ත්‍රානුසාරයෙන් පිහියා හෝ මෙවලම් මුවහත් කිරීම, කූරුවලට අතින් පැරපින් තෙල් පෙවීම, රාමුවලින් කූරු හලාගැනීම, පෙට්ටි අංශවල බෙහෙත් ගෑම, පිරවූ පෙට්ටි පරීක්ෂා කිරීම, මැෂින් ඩ්‍රයිවරයෙන් මුද්‍රා පටි ඇලවීම, පෙට්ටි අංශවල ගානා බෙහෙත් කවලම් කිරීම, පිට පෙට්ටි යන්ත්‍රයෙන් සෑදීම, පෙට්ටි පිරවීමට යන්ත්‍රානුසාරයෙන් පෙට්ටි යැවීම, බෙහෙත්වලට අතින් කූරු එබීම. | 365 0 |
| *3 වැනි ශ්‍රේණිය* | |
| කාවල්කාර වැඩ හැර ඉහත 1 වන ශ්‍රේණියේ හෝ 2 වැනි ශ්‍රේණියේ නිශ්චය කොට නැති (ගිනිපෙට්ටි තැනීමේ ව්‍යාපාරයේ) සියලු කම්කරුවන්ගේ වැඩ. | 350 0 |
| *4 වැනි ශ්‍රේණිය* | |
| කාවල්කාර වැඩ | 380 0 |

03-914/5

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**පුවත්පත් කලාවේදී කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ පුවත්පත් කලාවේදී කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් කරනු ලදුව මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරන තීරණ ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29 (3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2013 මාර්තු මස 01 දින සිට වලංගු විය යුතුය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2013 මාර්තු මස 01 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

පුවත්පත් කලාවේදී කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1986 ජූලි මස 25 වැනි දින අංක 411/19 දරන ගැසට් පත්‍රයෙහි පළවූ නිවේදනයේ උපලේඛනයේ සවිස්තරව දක්වා ඇත්තාවූ ද, අවසන්වරට 2010 ජුනි මස 30 වැනි දින අංක 1660/35 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදනයෙන් වෙනස් කරන ලද්දාවූ ද තීරණ එම උපලේඛනයෙහි II කොටස වෙනුවට පහත සඳහන් අළුත් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.

### II වන කොටස

සේවකයන්ගේ පන්තිය

*විශේෂ ශ්‍රේණිය* :

නියෝජ්‍ය කර්තෘ, සම කර්තෘ, විශේෂ ශ්‍රේණියේ කර්තෘ, කර්තෘ (දිනපතා)

*1 වන ශ්‍රේණිය* :

ව්‍යාපාරික කර්තෘ, ප්‍රධාන උප කර්තෘ, විශේෂාංග ප්‍රධානීන්, විදේශීය ප්‍රවෘත්ති කර්තෘ, විචිත්‍රාංග කර්තෘ,ප්‍රාදේශීය ප්‍රවෘත්ති කර්තෘ, ප්‍රවෘත්ති කර්තෘ, ක්‍රීඩා කර්තෘ, කන්තා පිටු සංස්කාරිකා, කර්තෘ (සතිපතා) චිත්‍ර කතා කර්තෘ.

*II වන ශ්‍රේණිය* :

සහකාර කර්තෘ, ප්‍රධාන කැමරා ශිල්පීන්, විශේෂාංග නියෝජ්‍ය අංශ ප්‍රධානීන්, විශේෂාංග ලියන්නන්, සහකාර කතුවැකි රචකයින් , පුස්තකාලයාධිපතීන්, උප කර්තෘ, විකට චිත්‍ර ශිල්පීන්, භාෂා පරිවර්තකයින්, ජ්‍යෙෂ්ඨ කැමරා ශිල්පීන්, චිත්‍ර ශිල්පීන්.

*III වන ශ්‍රේණිය* :

සහකාර පුස්තකාලයාධිපතීන්, වාර්තාකරුවන්, කැමරා ශිල්පීන්, කණිෂ්ඨ උප කර්තෘ, සෝදුපත් කියවන්නන්.

**මසකට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය**

| *සේවා වර්ෂය* | *විශේෂ ශ්‍රේණිය රු. ශ* | *I වන ශ්‍රේණිය රු. ශ* | *II වන ශ්‍රේණිය රු. ශ.* | *III වන ශ්‍රේණිය රු. ශ.* |
|---|---|---|---|---|
| 1 වසර | 19,580.00 | 16,070.00 | 15,055.00 | 14,235.00 |
| 2 වසර | 19,930.00 | 16,370.00 | 15,305.00 | 14,435.00 |
| 3 වසර | 20,280.00 | 16,670.00 | 15,555.00 | 14,635.00 |
| 4 වසර | 20,630.00 | 16,970.00 | 15,805.00 | 14,835.00 |
| 5 වසර | 20,980.00 | 17,270.00 | 16,055.00 | 15,035.00 |
| 6 වසර | 21,330.00 | 17,570.00 | 16,305.00 | 15,235.00 |
| 7 වසර | 21,680.00 | 17,870.00 | 16,555.00 | 15,435.00 |
| 8 වසර | 22,030.00 | 18,170.00 | 16,805.00 | 15,635.00 |
| 9 වසර | 22,380.00 | 18,470.00 | 17,055.00 | 15,835.00 |
| 10 වසර | 22,730.00 | 18,770.00 | 17,305.00 | 16,035.00 |
| 11 වසර | | 19,070.00 | 17,555.00 | 16,235.00 |
| 12 වසර | | 19,370.00 | 17,805.00 | 16,435.00 |
| 13 වසර | | 19,670.00 | 18,055.00 | 16,635.00 |
| 14 වසර | | 19,970.00 | 18,305.00 | 16,835.00 |
| 15 වසර | | 20,270.00 | 18,555.00 | 17,035.00 |

III වැනි ශ්‍රේණියේ පුහුණුවන්නන් පළමු වසර - රු. 9,460.00

03-914/6

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**මේස් භාණ්ඩ (හෝසියරි) නිෂ්පාදන කර්මාන්තය**

(136 වැනි අධිකාරය) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ මේස් භාණ්ඩ (හෝසියරි) නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව මෙහි වූ උපලේඛනයේ නිශ්චිතව සඳහන් තීරණ ගරු කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29 (3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2013 මාර්තු මස 01 දින සිට වලංගු විය යුතුය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2013 මාර්තු මස 01 වැනි දින,
කොළඹ දී ය.

***උපලේඛනය***

මේස් භාණ්ඩ (හෝසියරි) නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ වූ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1966 දෙසැම්බර් මස 09 වැනි දින අංක 14725 දරන *ගැසට් පත්‍රයෙහි* පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දාවූ සහ අවසන්වරට 2010 ජූනි මස 30 වැනි දින අංක 1660/35 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද්දා වූ ද තීරණ එහි II වැනි කොටස වෙනුවට පහත සඳහන් අලුත් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.

*II වැනි කොටස*

මසකට ගෙවියයුතු අවම වේතන ප්‍රමාණය

***I වැනි ශ්‍රේණිය***

ප්‍රධාන කම්කරුවෝ නොහොත් ප්‍රධානියෝ අංශ පරිපාලකවරු, ලේයින් මැෂින් ක්‍රියා කරවන්නෝ.

***II වැනි ශ්‍රේණිය***

කියර් බොයිලේරු ක්‍රියා කරවන්නෝ, වාෂ්ප බොයිලේරු ක්‍රියා කරවන්නෝ, සෝදන යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ, සායම් පොවන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, ස්ටේන්ටරින් යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, මිරිකන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, කැලැන්ඩර කරන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, වේලන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, යන්ත්‍ර මැකැනික්වරු (සාමාන්‍ය), සායම් පොවන්නෝ (පිරිමි), ගොතන යන්ත්‍ර මැකැනික්වරු, ස්ක්‍රීන් මුද්‍රණකරුවෝ, ස්ක්‍රීන් මුද්‍රණ ක්‍රියාකරවන්නෝ (ගැහැණු), ස්ක්‍රීන් මුද්‍රණ කරන සහායකයෝ, මහන යන්ත්‍ර මැකැනික්වරු.

***III වැනි ශ්‍රේණිය***

රෙදි අතුරන කම්කරුවෝ (ගැහැණු), කපන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, විදුලි බලයෙන් ක්‍රියා කරන කපන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, කපන්නෝ (අතින්), මහන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, රෙදි තම්බන කම්කරුවෝ, සුදු කරන්නෝ (පිරිමි), ගොතන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, අලුත්වැඩියා කරන කම්කරුවෝ (ගැහැණු), ට්‍රිම් කරන කම්කරුවෝ (ගැහැණු), මදින කම්කරුවෝ (ගැහැණු), මදින කම්කරුවෝ (පිරිමි), විදුලි බලයෙන් රෙදි මදින යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, හරි වැරදි බලන කම්කරුවෝ (ගැහැණු), තෝරන කම්කරුවෝ (ගැහැණු), අසුරන්නෝ, අසුරන හා මුද්‍රා තබන කම්කරුවෝ (ගැහැණු), සපත්තු ලේස් කෝඩ් සාදන සහ වෙන් කරන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, සෙලෝපේන් මළු සහ කාඩ්බෝඩ් පෙට්ටි සාදන්නෝ, ඔතන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ.

***IV වැනි ශ්‍රේණිය***

ආධුනිකයෝ සහ වෘත්තිය හදාරන්නෝ (ඉහත සඳහන් වෘත්තීය හදාරන්නෝ හෝ ආධුනිකයෝ සම්බන්ධයෙන් ආධුනික කාලය වැඩ කරන දින 156 කින් යුක්ත වූ කාල සීමාවන් ලෙස සැළකිය යුතුය).

**මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය**

| සේවා වසර | *I ශ්‍රේණිය* රු. ශ. | *II ශ්‍රේණිය* රු. ශ. | *III ශ්‍රේණිය* රු. ශ. | *IV ශ්‍රේණිය* රු. ශ. |
|---|---|---|---|---|
| 1 වසර | 9,750.00 | 9,360.00 | 8,970.00 | 5,635.00 |
| 2 වසර | 9,900.00 | 9,485.00 | 9,070.00 | |
| 3 වසර | 10,050.00 | 9,610.00 | 9,170.00 | |
| 4 වසර | 10,200.00 | 9,735.00 | 9,270.00 | |
| 5 වසර | 10,350.00 | 9,860.00 | 9,370.00 | |

03-914/7

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**සාත්තු නිවාස ව්‍යාපාරය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන ) පඩිපාලක සභා ආඥාපනතේ 30 වන වගන්තිය යටතේ සාත්තු නිවාස ව්‍යාපාර කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරන තීරණ ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමන් විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29 (3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2013 මාර්තු මස 01 දින සිට වලංගු විය යුතුය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2013 මාර්තු මස 01 වැනි දින,
කොළඹ දී ය.

*උපලේඛනය*

සාත්තු නිවාස ව්‍යාපාරය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1974 මාර්තු මස 22 වන දින අංක 104 දරන ගැසට් පත්‍රයෙහි පළකරන ලද නිවේදනයේ වූ උපලේඛනයේ සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කලට වෙනස් කරන ලද්දා වූද, අවසන් වරට 2010 ජුනි මස 30 වැනි දින අංක 1660/35 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරනු ලැබූ තීරණ එම උපලේඛනයෙහි II වන කොටස වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.

*II වන කොටස*

***කම්කරුවාගේ පන්තිය***

*I වැනි ශ්‍රේණිය*

මේට්‍රන්වරියන්, ඇපොතිකරිවරුන්.

*II වැනි ශ්‍රේණිය*

ඖෂධවේදීන්, සාත්තුකාර සහෝදරියන්, රසායනාගාර ශිල්පීන්, එක්ස්රේ කාර්මිකයන්.

*III වැනි ශ්‍රේණිය*

(අ) සාත්තු සේවිකාවන්, වින්නඹුවන්, ගබඩා භාරකරුවන්

(ආ) පුහුණුව ලබන සාත්තු සේවිකාවන්

1 වැනි වසරේ පුහුණුව සඳහා
2 වැනි වසරේ පුහුණුව සඳහා
3 වැනි වසරේ පුහුණුව සඳහා

*IV වැනි ශ්‍රේණිය*

ලිපිකරුවන්, යතුරු ලේඛකයින්, අමුත්තන් පිළිගන්නන්, දුරකථන ක්‍රියාකරුවන් , අයකැමියන්

*V වැනි ශ්‍රේණිය*

උපස්ථායකයින්, ඩිස්පෙන්සර්වරුන්, ශල්‍ය ඩෙසර්වරුන්, ස්ටුවර්ඩ්වරුන්, ඕවර්සියර්වරුන්, වාට්ටු ලිපිකරුවන්, කෑම වට්ටෝරු ලිපිකරුවන්.

*VI වැනි ශ්‍රේණිය*

ඕඩර්ලිවරුන්, පියන්වරුන්, අරක්කැමියන්, මුරකරුවන්, කසල ශෝධක කම්කරුවන්

VII වැනි ශ්‍රේණිය

ලිනන් කාමරවල උපස්ථායකයින්, කම්කරුවන්, උද්‍යාන කම්කරුවන්, අමදින්නන්, පැන්ට්‍රි බෝයිස්.

* පුහුණුව ලබන සාත්තු සේවිකාවන් සම්බන්ධයෙන් "වසර " යන්නෙන් අදහස් කරනුයේ දොළොස් මසක සේවා කාලයකි.

**මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය**

| සේවා වර්ෂය | *I ශ්‍රේණිය* රු.ශත | *II ශ්‍රේණිය* රු.ශත | *III ශ්‍රේණිය (ඒ)* රු.ශත | *III ශ්‍රේණිය (බී)* රු.ශත | *IV ශ්‍රේණිය* රු.ශත | *V ශ්‍රේණිය* රු.ශත | *VI ශ්‍රේණිය* රු.ශත | *VII ශ්‍රේණිය* රු.ශත |
|---|---|---|---|---|---|---|---|---|
| 1 වන වසර | 11,175.00 | 10,935.00 | 10,530.00 | 6,620.00 | 10,205.00 | 9,880.00 | 9,560.00 | 9,315.00 |
| 2 වන වසර | 11,425.00 | 11,160.00 | 10,730.00 | 6,770.00 | 10,380.00 | 10,030.00 | 9,685.00 | 9,415.00 |
| 3 වන වසර | 11,675,00 | 11,385,00 | 10,930.00 | 6,920.00 | 10,555.00 | 10,180.00 | 9,810.00 | 9,515.00 |
| 4 වන වසර | 11,925.00 | 11,610.00 | 11,130.00 | | 10,730.00 | 10,330.00 | 9,935.00 | 9,615.00 |
| 5 වන වසර | 12,175,00 | 11,835.00 | 11,330.00 | | 10,905.00 | 10,480.00 | 10,060.00 | 9,715.00 |
| 6 වන වසර | 12,425,00 | 12,060.00 | 11,530.00 | | 11,080.00 | 10,630.00 | 10,185.00 | 9,815.00 |
| 7 වන වසර | 12,675.00 | 12,285.00 | 11,730.00 | | 11,255.00 | 10,780.00 | 10,310.00 | 9,915.00 |
| 8 වන වසර | 12,925.00 | 12,510.00 | 11,930.00 | | 11,430.00 | 10,930.00 | 10,435.00 | 10,015.00 |
| 9 වන වසර | 13,175.00 | 12,735.00 | 12,130.00 | | 11,605.00 | 11,080.00 | 10,560.00 | 10,115.00 |
| 10 වන වසර | 13,425.00 | 12,960.00 | 12,330.00 | | 11,780.00 | 11,230.00 | 10,685.00 | 10,215.00 |

03-914/8

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**සම්පදම් කිරීම, පාවහන් හා සම්භාණ්ඩ සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ සම්පදම් කිරීම, පාවහන් හා සම්භාණ්ඩ සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති තීරණ ගරු කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29 (3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2013 මාර්තු මස, 01 දින සිට වලංගු විය යුතුය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2013 මාර්තු මස 01 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

සම්පදම් කිරීම, පාවහන් හා සම්භාණ්ඩ සෑදීමේ කර්මාන්තය පිළිබඳ වූ පඩි පාලක සභාව විසින් ඇති කරනු ලදුව 1970 අගෝස්තු මස, 28 වැනි දින අංක 14921 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූවා වූ නිවේදනයෙහි වූ උපලේඛනයේ සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කළින් කල වෙනස් කරන ලද්දාවූ ද, අවසන් වරට 2010 ජුනි මස 30 වැනි දින අංක 1660/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දා වූ ද උපලේඛනයට පහත දැක්වෙන කොටස් ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.

II වැනි කොටස

සම්පදම් කිරීම, පාවහන් හා සම්භාණ්ඩ සෑදීමේ කර්මාන්තයේ නියුක්ත පහතින් දක්වා ඇති සේවක පන්තිවලට අදාළ කම්කරුවන්ට කාල මිම්මේ වැඩ වෙනුවෙන් අදාළ වන අවම මාසික වේතන ප්‍රමාණය පහත වගුවෙන් දැක්වෙන පරිදි විය යුතුය.

**සේවක පන්ති**

*සම්පදම් කිරීම*

***I වැනි ශ්‍රේණිය*** :

අමු සම් ශුද්ධ කිරීම, හුණු වලෙහි දමා සම් තැම්බීම, සම්වලින් ලොම් ඉවත් කිරීම, සමෙහි ජර් කැපීම, රසායනික ද්‍රව්‍ය ආලේප කිරීම, පදම් කිරීමෙන් පසු සම් ශුද්ධ කිරීම, තෙල් ගෑම, සම් තුනී කිරීම, සම් මොලොක් කිරීම, දියෙහි දැමීම, ලුණු අතගෑම, සම් මැදීමෙන් තෙල් ඉවත් කිරීම.

***II වැනි ශ්‍රේණිය*** :

සම් තැලීම, සම්පාට කිරීම, පෙරලා අට්ටි ගැසීම, යුත්තු කැපීම, සම් තේරීම හා වර්ග කිරීම, වැලි කඩදාසි අල්ලා ශුද්ධ කිරීම, යන්ත්‍ර ක්‍රියා කරවීම, සමෙහි රැලි ඉවත් කිරීම.

***III වැනි ශ්‍රේණිය*** :

පිටි අතගා වේලීම, සම් වේලීම, ශුද්ධ කරන්නන් හා අතු ගාන්නන්ගේ වැඩ, ඉහත සඳහන් වැඩවලට සම්බන්ධ හෝ ඊට ආනුශාංගික වූ වෙනත් කාර්යයන්.

***පාවහන් නිපදවීම හා අළුත්වැඩියා කිරීම*** :

***I වැනි ශ්‍රේණිය*** :

සංයෝග කිරීම, උඩුකර සෑදීම, ආස්කර ඇලවීම (යාන්ත්‍රික), පතුල් කැපීම, උඩුකර කැපීම, වටේ කැපීම, ඇණ තැබීම, පතුල් තද කිරීම, විලුම් තද කිරීම, විලුම් සෑදීම, උඩුකර යන්ත්‍රානුසාරයෙන් කැපීම, ඒජ් සෙට් කිරීම.

*II වැනි ශ්‍රේණිය* :

උඩුකර බයිංඩිං මැසීම, සිදුරු කිරීම, හැරීම, බකල් සවි කිරීම, පතුල් මැසීම, පතුල් මැදීම, රැහීම, සොලියුෂන් සෑදීම, වැම්ප් ඇලවීම, අයිලට් සවි කිරීම.

*III වැනි ශ්‍රේණිය* :

රබර් බදාම මිශ්‍ර කිරීම, පටි කැපීම, උඩුකර රිවට් කිරීම, බදාමයෙහි ගිල්වීම, උඩුකර ඇතුල් කිරීම, උඩුකර සකස් කිරීම, පිටුපස බැස්ම ඇලවීම , පතුල් ඇලවීම, ඔප දැමීම, නිම කිරීම, පෙට්ටි නිකුත් කිරීම, පෙට්ටිවල ලේබල් ඇලවීම, පෙට්ටි මුද්‍රා කිරීම, ශුද්ධ කරන්නන්ගේ සහ අතුගාන්නන්ගේ වැඩ, ඉහත සඳහන් වැඩ වලට සම්බන්ධ හෝ ඊට අනුශාංගික වූ වෙනත් කාර්යයන්.

සම් භාණ්ඩ සෑදීම

*I වැනි ශ්‍රේණිය* :

යන්ත්‍රයෙන් හා අතින් කැපීම, සම් විදීම හා සිදුරු කිරීම, රිවට් සවි කිරීම, තද කිරීම, ගමන් මළු ඩොකියුමන්ට් කේස් හා පසුම්බි සෑදීම, (අතින්), ෆුට් බෝල්, වොලිබෝල් සහ නෙට්බෝල් සෑදීම.

*II වැනි ශ්‍රේණිය* :

ස්ටඩ් බකල් සහ බොත්තම් සවි කිරීම, මුද්‍රා කිරීම, යතුරු තහඩු උපකරණ හා හැන්ඩ්ල් සවි කිරීම, මැහීම, ගමන් මළු ඩොකියුමන්ට් කේස් හා පසුම්බි සෑදීම (යාන්ත්‍රානුසාරයෙන්),

*III වැනි ශ්‍රේණිය* :

සලකුණු කිරීම, බදාම සහ පාප්ප ගෑම, නිම කිරීම, පිම්බීම, හා මුද්‍රා තැබීම

*වෘත්තිය හදාරන්නෝ සහ ආධුනිකයෝ*

ඉහත වෘත්තීය හදාරන්නෙකු හෝ ආධුනිකයෙකු සම්බන්ධයෙන් ආධුනික කාලය වැඩ කරන දින 156 කින් යුතු වූ කාලසීමාවක් ලෙස සැලකිය යුතුය.

**ගෙවිය යුතු අවම මාසික වේතන ප්‍රමාණය**

| *සේවා වසර* | *සම් පදම් කිරීම, පාවහන් හා සම්භාණ්ඩ සෑදීම* | | | |
|---|---|---|---|---|
| | *I ශ්‍රේණිය රු. ශත* | *II ශ්‍රේණිය රු. ශත* | *III ශ්‍රේණිය රු. ශත* | *වෘත්තීය හදාරන්නෝ හා ආධුනිකයෝ රු. ශ.* |
| 1 වන වසර | 10,500.00 | 10,080.00 | 9,660.00 | 5,820.00 |
| 2 වන වසර | 10,650.00 | 10,205.00 | 9,760.00 | |
| 3 වන වසර | 10,800.00 | 10,330.00 | 9,860.00 | |
| 4 වන වසර | 10,950.00 | 10,455.00 | 9,960.00 | |
| 5 වන වසර | 11,100.00 | 10,580.00 | 10,060.00 | |

03-914/9

## නිවැරදි කිරීමයි

**පඩිපාලක සභා ආඥාපනත**

**මුද්‍රණ කර්මාන්තය**

2012.12.18 වැනි දින අංක 1789/19 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ I කොටස : (I) ඡෙදය : සාමාන්‍ය, රජයේ නිවේදන යටතේ ඉහත මාතෘකාවෙන් අංක 65/2 දරන දැන්වීම මුද්‍රණ දෝෂයක් හේතුකොට නිවැරදි කිරීමක් 2013.01.22 දින අංක 1794/11 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ අංක 257 දැන්වීමෙන් නිවැරදි කළ ද, එම නිවැරදි කිරීමේ දැන්වීමේ බලයලත් නිලධාරියා ලෙස "ආර්. ඩබ්ලිව්. කුලරත්න බණ්ඩාර, වැඩ බලන කම්කරු කොමසාරිස්" යන්න මුද්‍රණ දෝෂයක් හේතුකොට මුද්‍රණය වී ඇති අතර එය "ඩබ්ලිව්. ජේ. එල්. යූ. විජයවීර, ලේකම්, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය" ලෙස නිවැරදි විය යුතු බවත්, එම නිවැරදි කිරීමේ දැන්වීම නැවත පහත සඳහන් පරිදි පළ කෙරේ.

## නිවැරදි කිරීමයි

**පඩිපාලක සභා ආඥාපනත**

**මුද්‍රණ කර්මාන්තය**

2012.12.18 වැනි දින අංක 1789/19 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ I කොටස : I ඡෙදය : සාමාන්‍ය රජයේ නිවේදන යටතේ ඉහත මාතෘකාවෙන් අංක 65/2 දරන දැන්වීමේ 2A පිටුවේ "මෙම තීරණ 2013.07.07 වැනි දින සිට වලංගු විය යුතු ය" යන්න මුද්‍රණ දෝෂයක් හේතුවෙන් මුද්‍රණය වී ඇති අතර එය "මෙම තීරණ 2013.01.01 වැනි දින සිට වලංගු විය යුතුය" ලෙස නිවැරදි විය යුතුය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2013 ජනවාරි මස 21 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේදී ය.

03-915

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.